# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2082/39 - 2018 අගෝස්තු මස 01 වැනි බදාදා - 2018.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

2017 වර්ෂයේ අංක 07 දරන ප්‍රඥප්තිය

### උතුරු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

උතුරු පළාතේ, පළාත් සභාව විසින් 2017 වර්ෂයේ අගෝස්තු මස 24 වැනි දින සම්මත කරන ලද 2017 වර්ෂයේ අංක 07 දරන උතුරු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018 වර්ෂයේ ජූලි මස 25 වැනි දින අනුමැතිය ලබා දී තිබෙන බව මෙමගින් දැනුවත් කරනු ලැබේ.

ආර්. වරතීශ්වරන්,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

2018 ජූලි මස 27 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
ඒ 9 මාර්ගය,
කයිතඩි.

### උතුරු පළාතේ, පළාත් සභාව

2017 අංක 07 දරන උතුරු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 09 වැනි උපලේඛනයේ අංක 01 දරන ලැයිස්තුවේ 17 වැනි විෂය යටතේ උපවගන්ති 17.3 සහ 17.4 අනුව උතුරු පළාත් සමුපකාර සේවයේ යෙදී සිටින සමුපකාර සමිති සේවකයින් සම්බන්ධව නීති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ එයට ආනුෂාංගික කරුණු සඳහා විධිවිධාන ඇති කිරීම සඳහාත් වන උතුරු පළාතේ, පළාත් සභාව යටතේ වන සමුපකාර සේවක කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීමේ ප්‍රඥප්තිය.

මෙම ප්‍රඥප්තිය 1992 අංක 21 දරන (සංශෝධන) පනත සමග කියවෙන 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනතට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාතේ පළාත් සභාව විසින් පහත සඳහන් පරිදි ප්‍රඥප්ති සම්පාදනය කරනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

01. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ පළාත් සභාව විසින් 2017 අංක 07 දරන උතුරු පළාත් සමූපකාර සේවක සභාවේ ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වන අතර උතුරු පළාත් ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබාදෙන දින සිට ක්‍රියාත්මක වේ.

අමාත්‍යවරයාට මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලින් සමූපකාර සමිති නිදහස් කිරීමේ බලය ඇති බව.

02. අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලින් පහත සඳහන් සමූපකාර සමිති නිදහස් කළ හැකි ය.

(අ) උතුරු පළාතේ පිහිටි එහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් සමූපකාර සමිති වර්ගයකට ; හෝ

(ආ) උතුරු පළාතේ පිහිටි එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් සමූපකාර සමිතියක් මෙය සම්බන්ධයෙන් මතුවට එන විධිවිධානවල, සමූපකාර සමිතිය, යන යෙදුම අදාළ කාල පරිච්ඡේදයෙහි ක්‍රියාත්මක වන පෙර සඳහන් ආඥාවෙහි ඇතුළත් නොවන සමූපකාර සමිතිය වශයෙන් අදහස් වන ලෙස කියවා තේරුම් ගත යුතු ය.

## I වන කොටස

### *උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම සහ එහි බලතල හා කාර්යයන්*

සමූපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම.

03. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා මින් මතුවට, සමූපකාර සේවක කොමිෂන් සභාව, යනුවෙන් හඳුන්වනු ලබන උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබේ.

04. (1) පහත සඳහන් විධිවිධාන අනුව මෙම කොමිෂන් සභාව පිහිටුවනු ලැබේ.

කොමිෂන් සභාවේ සංස්ථිතිය.

(2) මෙම කොමිෂන් සභාව උතුරු පළාත් සභාවේ සමූපකාර විෂයට අදාළ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තිදෙනෙකුගෙන් සමන්විත වේ.

(3) යම් තැනැත්තකු පහත සඳහන් නුසුදුසුකම් ලත් අයෙකු වේ නම් ඔහු එම තනතුරට නුසුදුස්සෙකු වේ.

(අ) සමූපකාර සමිතියක සේවකයෙකු හෝ හිටපු සේවකයෙකු වීම.

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව සමූපකාර සේවකයින්ගේ වැටුප්, වේතන හා සේවා කොන්දේසි මූලික කරගත් කොන්දේසි සකස් කරන අරමුණකින් පවත්වනු ලබන වෘත්තීය සමිතියක සාමාජිකයෙකු වීම.

(ඇ) සමූපකාර සමිතිවලට අදාළ නීති යටතේ පිහිටුවා ඇති සමූපකාර සමිතියක තනතුරක් දරන කෙනෙක් හෝ දරූ කෙනෙක්.

(ඈ) තත් කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභික තනතුරක් දරන සාමාජිකයෙකු වීම.

(ඉ) සමූපකාර සමිතියක හෝ සමූපකාර සේවකයින්ගේ අවසන් නොවූ නීති කෘත්‍යයක් සම්බන්ධව ඉදිරිපත් වූ හෝ ඉදිරිපත් වන නීති නියෝජිතයෙකු හෝ විනය පරීක්ෂණ නිලධාරී හෝ සේවකයින් හෝ නිලධාරියෙකුගේ හැසිරීම් පිළිබඳව නිරීක්ෂණය කරන නිලධාරියෙකුගේ වශයෙන් හෝ සේවකයින්ගේ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරියෙකු වීම.

(ඊ) දැනට සමූපකාර විෂයභාර අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ සේවකයෙකු වීම.

05. කොමිෂන් සභාව අවිච්ඡින්න පැවැත්මක් ඇති හා පොදු මුද්‍රාවක් සහිත නඩු පැවරීමට හා නඩු පැවරීමට යටත් වන සංස්ථාගත ආයතනයකි. කොමිෂන් සභාව සංස්ථාගත කිරීම.

06. (1) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙකුම පත් කරන ලද දින සිට වර්ෂ තුනක් ගතවන තුරු ධූරය දැරිය යුතු ය. සාමාජිකයන්ගේ නිල කාලය

එසේ වුව ද,

පහත සඳහන් හේතුන් යටතේ, එනම්

(අ) යම් සාමාජිකයෙකු තම ධූරයෙන් ඉල්ලා අස්වෙන බවට ලිඛිතව අමාත්‍යවරයාට දැනුම් දීමෙන් හෝ අමාත්‍යවරයා විසින් සාධාරණ හේතු මත ඔහුව ධූරයෙන් ඉවත් කිරීමෙන් ; හෝ

(ආ) 4 (3) වගන්තිය යටතේ යම් සාමාජිකයෙකු අදළ ධූරයට නුසුදුස්සෙකු බවට පත් වුවහොත්, ධූරය පුරප්පාඩු වේ.

තව ද, යම් සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන් හෝ මිය යාම හෝ සේවය හැරයාම හෝ අමාත්‍යවරයා විසින් කාලයට පෙර ධූරයෙන් ඉවත් කර තිබේ නම් හෝ එසේ ඇති වන පුරප්පාඩුව පිරවීමේ අයිතිය අමාත්‍යවරයා සතු වේ. එසේ පත්කරනු ලබන සාමාජිකයා තමා විසින් ධූර කාලයට පෙර ධූරයෙන් ඉවත් වුවොත් මිස ධූරයට අදළ ඉතිරිව ඇති කාලයට පමණක් ධූරය දැරිය හැකිය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇති ඕනෑම පුද්ගලයෙකු අමාත්‍යවරයාගේ තීරණයට යටත්ව යළි පත්වීමට සුදුසු වන්නේ ය. එසේ පත්කරනු ලබන සාමාජිකයෙකු දෙවරකට වඩා සාමාජිකයෙකු ලෙස පත්විය නොහැක.

07. (1) අමාත්‍යවරයා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු එහි සභාපති වශයෙන් පත් කළ යුතු වන්නේ ය. එසේ පත් කරනු ලබන සභාපති වන ඔහු/ඇය පැමිණ සිටින සෑම අවස්ථාවකම කොමිෂන් සභා රැස්වීම්වල දී මූලාසනය දැරිය යුතුය. සභාපති පැමිණ නොමැති විට පැමිණ සිටින අයවලුන්ගෙන් තෝරාගත් සාමාජිකයෙකු එහි මූලාසනය දැරිය හැකි ය. සභාපතිගේ සහ කොමිෂන් සභාවේ කාර්යයන්.

(2) කොමිෂන් සභාවේ රැස්වීමට සාමාජිකයින් දෙදෙනෙකු ගේ පැමිණීම ගණපූරණය සඳහා ප්‍රමාණවත් වන්නේ ය.

(3) යම් රැස්වීමක් සඳහා සාමාජිකයින් දෙදෙනෙකු පමණක් පැමිණ සිටින අවස්ථාවක, යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ඇති අවස්ථාවක, එම සාමාජිකයින් දෙදෙනාගේ තීරණය බෙදීමක් වන විට, එවැනි ප්‍රශ්නයක් සාමාජිකයින් තිදෙනාම සහභාගී වන රැස්වීමකට යොමු කළ යුතු ය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනාම සහභාගී වී සිටින රැස්වීමක දී යම් කාරණයක් සම්න්ධයෙන් ගතයුතු තීරණය පිළිබඳව සාමාජිකයින් අතරේ මතභේද ඇතිවන්නේ නම් වැඩි දෙනාගේ මතය අනුව තීරණය කළ යුතු වේ.

(5) මෙම ප්‍රඥප්තියේ හෝ මේ අනුව නිතුත් වන නියෝගයක විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කළ හැකි ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ පුරප්පාඩුවක් තිබීමෙන් හෝ පත් කිරීම සම්බන්ධයෙන් යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් හෝ කොමිෂන් සභාව විසින් ගන්නා තීරණ හෝ පනවනු ලබන නියෝග අවලංගු නොවිය යුත්තේ ය.

08. කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයින්ට පරිශ්‍රමිකයන් හා අනෙකුත් ගෙවීම් සමූපකාර අමාත්‍යවරයා විසින් මුදල් පිළිබඳ විෂය භාර පළාත් ඇමතිවරයාගේ උපදෙස් මත තීරණය කළ යුතු ය. සාමාජිකයින්ගේ ගෙවීම්

09. (1) කොමිෂන් සභාවේ ලේකම්වරයා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු විය යුත්තේ ය. ලේකම් සහ අනෙක් නිලධරයන්.

(2) කොමිෂන් සභාවේ අනෙකුත් කාර්යය මණ්ඩලය ස්ථාන මාරුවීම් සහිත පළාත් රාජ්‍ය සේවයෙන් පත් කළ යුතු වන්නේ ය.

කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ නිලධරයන් දිවුරුම් දීම.

10. (1) කොමිෂන් සභාවේ සභාපති සහ සෙසු සාමාජිකයින් වශයෙන් පත්වීම් ලැබූ අය තම කටයුතු ආරම්භ කිරීමට පෙර මෙම ප්‍රඥප්තියේ උපලේඛනයේ සඳහන් 1 වන ආකෘතිය අනුව දිවුරුම් හෝ ප්‍රතිඥාවක් හෝ දිය යුතු වන්නේ ය.

(2) ලේකම් සහ කාර්ය මණ්ඩලයේ සෙසු නිලධාරීන් පළමු පත්වීමේ දී කොමිෂන් සභාවේ සභාපති ඉදිරියේ දී මෙම ප්‍රඥප්තියේ උපලේඛනයෙහි සඳහන් 2 වන ආකෘතිය අනුව දිවුරුම් හෝ ප්‍රතිඥා දිය යුතු ය.

කොමිෂන් සභාවේ බලතල.

11. (1) කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතු ය.

(අ) සමූපකාර සමිතිවලට සියලුම සේවකයින් බඳවා ගැනීම, දියුණු කිරීම සඳහා වෘත්තීය කොන්දේසි සහ මූලික ප්‍රතිපත්ති ඇතුළත් බඳවා ගැනීමේ ක්‍රම සම්බන්ධිත සියලු කටයුතු, එසේම යම් තනතුරකට පත් කිරීමේදී හා යම් සමිතියක එක් තනතුරකින් තවත් තනතුරකට උසස් කිරීමේ දී අදාළවන සියලු ප්‍රතිපත්ති සකස් කිරීම.

(ආ) අවශ්‍ය වූ අවස්ථාවල දී සමූපකාර සමිතිවලට සේවකයින් බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීම්, එවැනි විභාග පැවැත්වීම සඳහා විභාග පරීක්ෂණ මණ්ඩල පත් කිරීම සහ එවැනි විභාග සඳහා පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් ගාස්තු අය කිරීම.

(ඇ) සමූපකාර සමිතිය කිසියම් තනතුරකට සේවකයින් පත් කිරීමේ දී ඔවුන් සතුව තිබිය යුතු සුදුසුකම් නිශ්චය කිරීම, යම් පංතියක/ශ්‍රේණියක තනතුරට අදාළ වැටුප් පරිමාවන් නිශ්චය කිරීම, කළින් කලට එසේ නිශ්චය කරන ලද වැටුප් පරිමාවන් සංශෝධනයට ලක් කිරීම, එසේම කොමසාරිස්වරයා සමග සාකච්ඡා කර, කොමසාරිස්වරයාට යෝග්‍ය යැයි හැගෙන සමූපකාර සේවකයින්ගේ පාරිශ්‍රමිකය හා සේවා කොන්දේසි තීරණය කිරීම සඳහා උපදේශාත්මක යාන්ත්‍රණයක් පිහිටුවීම.

(ඈ) කොමිෂන් සභාව එසේ නිශ්චය කරන ලද වැටුප් පරිමාවන් අනුව යම් පංතියකට හෝ ශ්‍රේණියකට අයත් තනතුරට හෝ තනතුරුවලට වැටුප් ගෙවන ලෙසට සමූපකාර සමිතිවලින් ඉල්ලා සිටීම.

(ඉ) සමූපකාර සමිතිය තම සේවකයින්ට විරුද්ධව පවත්වන විනය කටයුතුවල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ පටිපාටීන් නිශ්චය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලතල නිශ්චය කිරීම සහ නියම කරන ලද කාලය තුළ දී විනය කටයුතු අවසන් කරන ලෙස සමූපකාර සමිතිවලින් ඉල්ලා සිටීම සහ යම් සමූපකාර සමිතියක් විසින් දෙන ලද විනය නියෝගයකට විරුද්ධව ඉදිරිපත් කරන අභියාචනා විභාග කිරීම.

(ඊ) යම් සමූපකාර සමිතියක තම සේවකයින් පිළිබඳව නියමිත වාර්තාවන් පවත්වාගෙන යා යුතු බවට නියම කිරීම.

(උ) තම සේවකයින් පිළිබඳව කොමිෂන් සභාවට අවශ්‍ය වන ලිපිගොනු සහ වෙනත් ලියකියවිලි හෝ විස්තර වාර්තා, නියමිත දිනට පෙර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස හෝ නිකුත් කරන ලෙස සමිතියට නියම කිරීම.

(ඌ) කොමිෂන් සභාව වෙත එවනු ලබන අභියාචනා පිළිබඳව අවශ්‍ය පරීක්ෂණ පවත්වා නිර්දේශ සහිතව කොමිෂන් සභාවට වාර්තා කිරීම සඳහා අභියාචනා පරීක්ෂණ නිලධාරී හෝ නිලධාරීන්ගෙන් සමන්විත මණ්ඩලයක් පත් කිරීම.

(එ) සමූපකාර සමිතිය කිසියම් සේවකයෙකුගේ ක්‍රියා කලාපය පිළිබඳව විනය පරීක්ෂණය පවත්වා එකී සේවකයා විසින් සමිතිය නිකුත් කළ විනය නියෝගයට එරෙහිව කොමිෂන් සභාව වෙත අභියාචනාවක් කර ඇති අවස්ථාවල දී එවැනි අභියාචනාව සැලකිල්ලට ගෙන එම සේවකයාව නැවත සේවයේ පිහිටුවීම ඇතුළුව, කොමිෂන් සභාවේ නිකුත් කරන නියෝග එහි සඳහන් ආකාරයට ක්‍රියාත්මක කරන ලෙස සමූපකාර සමිතියෙන් ඉල්ලා සිටිය හැකි ය.

(ඒ) සේවකයින්ගේ සේවය අවසන් කිරීමේ දී පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ ගෙවීමේ දී ඒ සඳහා වන පොදු ප්‍රතිපත්ති නිශ්චය කිරීම.

(ඔ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීමේ දී යම් සමූපකාර සමිතියක් හෝ යම් පන්තියක සමූපකාර සමිති නිදහස් කිරීම සම්බන්ධව කොමසාරිස් විමසා අමාත්‍යවරයාට උපදෙස් දීම.

(ඕ) පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු අමාත්‍යවරයා විසින් ගැසට් නිවේදනයෙන් පනවනු ලබන නියෝගයකින් කොමිෂන් සභාව නිකුත් කළ හැකි සමූපකාර සමිතිවලටත් එහි සේවකයන්ටත් අදාළ වෙනත් බලතල ක්‍රියාත්මක කිරීම.

(2) ඉහත (1) උපවගන්තියේ සඳහන් කොමිෂන් සභා බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමිෂන් සභාව විසින් ගනු ලබන කිසියම් තීරණවල ඇති නියෝග වෙනස් කිරීමට හෝ සංශෝධන කිරීමට හෝ ඉවත් කිරීමට කොමිෂන් සභාවට හැකි ය.

12. කොමිෂන් සභාවේ වියදම් සඳහා වන මුදල් පළාත් සභාව විසින් වාර්ෂිකව වෙන්කර දිය යුතු ය. මුදල් විධිවිධාන.

## II වන කොටස

### *සමූපකාර සමිති සහ සේවකයින්*

13. යම් සේවකයෙකුගේ වැටුප හෝ වෙනත් පඩිනඩි තම අරමුදලින් යම් සමූපකාර සමිතියක් ගෙවන්නේ නම් එම සමිතිය එකී සේවකයාගේ සේවා යෝජකයා ලෙස සලකනු ලැබිය යුතු ය. සමූපකාර සමිතිය සේවායෝජකයකු වන බව.

14. සෑම සමූපකාර සමිතියක්ම හෝ එම සමිතියේ කවර හෝ සේවකයෙකු වුව ද මෙම ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාවේ විධානවලට යටත්විය යුතු ය. මෙම ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාව විසින් බලතල ඉටු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී කෙරෙන සියළුම නියෝග සහ 11(2) වගන්තියේ ප්‍රතිපාදනවලට අනුව නිකුත් වන නියෝග අනුගම්‍ය හා අවසානාත්මක වන අතර 2 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ ආඥාව අනුව මෙම ප්‍රඥප්තියේ කටයුතුවලින් නිදහස් කිරීම සඳහා සමූපකාර සමිති සහ එහි සේවකයින් බැඳී සිටිය යුතු ය. සමූපකාර සමිති එහි සේවකයන් කොමිෂන් සභාවේ නියෝගවලට යටත් විය යුතු බව.

15. යම්කිසි සමූපකාර සමිතියක යම්කිසි සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරනු ලබන සියලුම විධාන 11 (2) වගන්තියේ විධිවිධාන අනුව අවසානාත්මක වන අතර එම නියෝග සමිතිය විසින් නිකුත් කළා සේ එම සේවකයා අනුමග්‍ය වනු ඇත. සමූපකාර සමිති සේවකයින් කොමිෂන් සභාවේ නියෝගවලට බැඳී සිටිය යුතු බව.

16. යම් පුද්ගලයෙකු උතුරු පළාතේ යම් දිස්ත්‍රික්කයක අවම වශයෙන් අවුරුදු දෙකක්වත් පදිංචි වී නොමැති නම්, එම දිස්ත්‍රික්කයේ පිහිටි සමූපකාර සමිතියක යම් තනතුරකට එම පුද්ගලයා බඳවා නොගත යුත්තේ ය. එසේ වූවත්, කොමිෂන් සභාවේ මතය අනුව යම් දිස්ත්‍රික්කයක පිහිටි සමූපකාර සමිතියක එවැනි තනතුරකට සුදුස්සෙකු තෝරා ගැනීම එම දිස්ත්‍රික්කයෙන් අපහසු වන්නේ නම්, වෙනත් දිස්ත්‍රික්කයක සුදුසුකම් ලබා ඇති අයෙකු පත් කිරීමට සමූපකාර සමිතියට බලය දීමට කොමිෂන් සභාවට හැකි ය. පදිංචිය පිළිබඳ සුදුසුකම්.

17. යම් සමූපකාර සමිතියක කිසියම් තනතුරකට පත් කරන ලද ඕනෑම කෙනෙකුට එම තනතුරුට අදළ වැටුප් පරිමාණයන් ලබා දිය යුතු ය. සමූපකාර සමිතියක ශ්‍රේණිය සහ සේවකයින්ගේ ශ්‍රේණිය හෝ පංතිය අනුව වැටුප් ක්‍රම සකස් කළ යුතු බව.

එය 25 (1) වගන්තියේ සඳහන් අයුරින් සමිතියේ ශ්‍රේණිය අනුව තීරණය විය යුතු අතර සේවකයාගේ ශ්‍රේණිය හෝ පංතිය අනුව ද විය යුතු ය.

18. සෑම සමූපකාර සමිතියක්ම තම අරමුදලින් එකී සමිතියේ සේවකයින්ට වැටුප් සහ වෙනත් ගෙවීම් කළ යුතු ය. සමූපකාර සමිතියක සේවකයින්ගේ වැටුප්.

19. (1) සමූපකාර සමිතියක තම සේවා ස්ථානයක සේවය කරන සේවකයෙකු තමාට අයත් වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු කිරීමේ බලය ඇත්තේ ය. අදළ ස්ථාන මාරුව විනය කටයුත්තක් මත වන එකක් නොවේ නම්, එම සේවකයාගේ පඩිනඩි කෙරෙහි අහිත කර ලෙස හානියක් ඇති නොකළ යුතු වන්නේ ය. සේවකයින් ස්ථාන මාරු කිරීම.

(2) සේවායෝජකයින් වන සමිති දෙකකින් කලින් ලබා ගත් එකඟත්වය මත අදළ සමිතිවල සමාන ස්ථිර තනතුරුවල සේවය කරන එකඟත්වයෙන් ස්ථාන මාරුව සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ සේවකයින් දෙදෙනාම ස්ථාන මාරු කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(3) නියමිත සේවායෝජකයින්ගේ අනුමැතිය කලින් ලබාගෙන ඇත්නම්, සමූපකාර සමිතියක ඕනෑම සේවකයෙකු වෙනත් සමූපකාර සමිතියක සමාන තනතුරකට මාරු කිරීමට එම සේවකයාගේ එකඟතාවය මත කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

සමූපකාර සමිතියක සේවකයින් සේවයෙන් ඉවත් කිරීම සහ දඬුවම් ලබාදීම.

20. සමූපකාර සමිතියක සේවකයන් සේවයෙන් ඉවත් කිරීමට හෝ වෙනත් දඬුවම් ලබාදීමට මෙම ප්‍රඥප්තිය යටතේ හෝ එය යටතේ සාදන ලද නියෝගයේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලදැයි සලකන විධිවිධාන යටතේ හැර, කටයුතු නොකළ යුත්තේ ය.

සමූපකාර සමිති සේවකයින්ගේ සුරැකුම් මුදල්.

21. (1) කොමිෂන් සභාව නියම කරන යම් මුදලකට අධික මුදලක් සුරැකුම් මුදල වශයෙන් තැන්පත් කරන ලෙස සමූපකාර සමිති සේවකයින්ට නියම නොකළ යුතු ය.

(2) සේවකයෙකු විසින් සුරැකුම් වශයෙන් තැන්පත් කරන මුදල සමූපකාර සමිතිය තමාගේ නමින් බැංකුවක ආයෝජනය කළ යුතු අතර ඉන් ලැබෙන පොළිය අදළ සේවකයාට ගෙවිය යුතු වන්නේ ය.

සේවකයින්ට අදළ නියෝග.

22. (1) පහත සඳහන් ආකාරයෙන් -

(අ) සමූපකාර සමිතිවල සේවකයින් බඳවා ගැනීම, පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඉල්ලා අස්වීම සහ සේවය අවසන් කිරීම සම්බන්ධව.

(ආ) සේවකයින්ගේ සේවා නියමයන් සහ කොන්දේසි පනවමින් හෝ සේවකයන්ගේ වැටුප් පරිමාවන් සකස් කිරීම හා දිරිගැන්වීම්, දීමනා පාරිතෝෂික ගෙවීම, අත්තිකාරම් ගෙවීම, උසස් කිරීම, වැඩ තහනම් කිරීම, සේවය අවසන් කිරීම, වෙනත් දඬුවම් පැනවීම, නිවාඩු, විනය කටයුතු සහ අභියාචනා සම්බන්ධ හෝ කාර්ය නියමයන් සහ නීතිරීති අනුව හෝ

(ඇ) අවශ්‍ය යැයි සැලකෙන රැකියාවන්ට අදාළ වෙනත් කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) උතුරු පළාත් සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටුවා ඇති සියළුම සමූපකාර සමිති සහ එහි සේවකයින් මෙහි (1) උප වගන්තියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පනවනු ලබන සියළුම රෙගුලාසිවලට බැඳී සිටින්නේ ය.

සිය සේවකයින් සම්බන්ධයෙන් සමූපකාර සමිතිවල යුතුකම්.

23. සියලුම සමූපකාර සමිති -

(අ) සෑම සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියම කරන ලේඛන හා වාර්තා පවත්වාගෙන යා යුතු ය. සෑම සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව නියම කරන ආකාරයෙන් අදළ වන සියලුම විස්තර එහි ඇතුළත් කළ යුතු ය.

(ආ) කොමිෂන් සභාව සේවකයින් සම්බන්ධව නියම කළ හැකි වාර්තා සහ තොරතුරු එසේම කලින් කලට කොමිෂන් සභාවට අවශ්‍ය යැයි හැඟෙන ආකාරයේ තොරතුරු සැපයිය යුතු ය.

(ඇ) එවැනි සමිති කාර්යාලවලට ඇතුළත් වී එහි තබා ඇති පොත්පත්, ගිණුම් වාර්තා සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂා කර බැලීමටත්, එහි පිටපත් ලබා ගැනීමටත් බලය පවරනු ලැබූ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු හෝ නිලධාරියෙකුට ඉඩ දිය හැක.

සේවක අර්ථ සාධක අරමුදල.

24. සේවා යෝජකයෙකු වන සෑම සමූපකාර සමිතියක්ම, තම සේවකයින් සඳහා නීතියේ විධිවිධාන අනුව සේවක අර්ථ සාධක අරමුදලට නියමිත ප්‍රමාණයෙන් දයක විය යුතු ය. එසේම සේවකයින් ද ඊට දයක විය යුතු ය.

## III වන කොටස

### *කොමසාරිස්ගේ බලතල*

25. (1) සමූපකාර සමිති ශ්‍රේණිගත කිරීම සඳහාත්, ඒ සමිතිවල සේවකයින්ගේ ශ්‍රේණිය සහ පංතිය සහ එක් එක් ශ්‍රේණි හා ඒ ශ්‍රේණිවල සිටිය යුතු සේවක සංඛ්‍යාව නිශ්චය කිරීම හා අවශ්‍ය යැයි තමා අදහස් කරන අයුරින් කලින් කලට සංශෝධනය කිරීමේ බලයත් කොමසාරිස්ට තිබිය යුතු ය.

කොමසාරිස් විසින් සමිති ශ්‍රේණිගත කළ යුතු බව හා කාර්ය මණ්ඩල තීරණ කළයුතු බව.

(2) ඉහත (1) උපවගන්තිය අනුව කොමසාරිස් විසින් නියම කරන නියෝගයට පටහැනි වන ආකාරයෙන් කවර හෝ සමූපකාර සමිතියක් කවර හෝ තැනැත්තෙකුව සේවයට බඳවා නොගත යුතු ය.

26. කොමිෂන් සභාව, සමූපකාර සමිතිවල තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම. යම් පංතියක හෝ ශ්‍රේණියක යම් තනතුරකට හෝ තනතුරුවලට අනුයුක්ත කළ යුතු වැටුප් පරිමාණ නියම කිරීම ද, එම වැටුප් පරිමාණ කලින් කලට ප්‍රතිශෝධනය කිරීම ද කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව කළ යුතු ය.

සුදුසුකම් වැටුප් පරිමාණ ආදිය සඳහා කොමසාරිස්ගේ එකඟත්වය ලබා ගැනීම.

## IV වන කොටස

### *විවිධ කරුණු*

27. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී ඒ තුළ විධිවිධාන පනවා නැති හෝ සාර්ථක විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් සැකයක් හෝ දුෂ්කරතාවයක් උද්ගත වුවහොත්, අමාත්‍යවරයා විසින් *ගැසට් නිවේදනයකින්* එම දුෂ්කරතාවය හෝ සැකය ඉවත් කළ හැකි ය. එසේ නොමැති නම්, නිශ්චය කළ හැකි ය. එවැනි නියෝගයක් *ගැසට් පත්‍රයෙහි* පළ කිරීමෙන් පසු එයට නීතිමය බලය තිබිය යුතු ය.

දුෂ්කරතා ඉවත් කිරීම.

28. (1) නිශ්චිතව අන් ආකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, මෙම ප්‍රඥප්තිය යටතේ වූ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යැයි අදහස් කරන, එලෙසින් වන සියලුම රීති කොමිෂන් සභාව විසින් සෑදිය හැකි ය. නැතහොත් එහි සඳහන් ප්‍රතිපත්තිවලට ක්‍රියාකාරීත්වයක් ලබාදීමට හෝ නිශ්චය කර තිබෙන හෝ යම් කරුණක් සඳහා හෝ මෙම ප්‍රඥප්තියට ක්‍රියාකාරීත්වයක් ලබාදීමට මෙම ප්‍රඥප්තියේ සඳහන් සියලුම කරුණු සම්බන්ධයෙන් ද, එහි කුමන කුමන කරුණු සඳහා රීති සෑදිය හැකි බවට බලය පවරාදීම සම්බන්ධයෙන් ද, මෙම ප්‍රඥප්තියෙන් ප්‍රකාශිත හෝ අවශ්‍ය යැයි සලකනු ලබන සියලුම කරුණු සම්බන්ධයෙන් ද, කෙලෙසින් ක්‍රියාත්මක කළ යුතු ද, ඇතුළත්ව රීති සෑදිය හැකි ය.

කොමිෂන් සභාව විසින් රීති සෑදිය හැකි බව.

(2) කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ සියලුම රීති අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ, මාස 03ක් ඇතුළත උතුරු පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) උතුරු පළාත් සභාව විසින් අනුමත නොකරන ලද සෑම රීතියක්ම, එය අනුමත නොකළ දිනයේ සිට එනමුත් ඒ යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොවන පරිදි පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

29. කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගේ තත්ත්වයෙන් ක්‍රියා කිරීමේදී ගන්නා ලද තීරණ හෝ කරන ලද හෝ නොකරන ලද කිසියම් ක්‍රියාවක් සඳහා හෝ කොමිෂන් සභාවේ කිසියම් සාමාජිකයෙකුට හෝ විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයක් පැවරීම හෝ පවත්වාගෙන යෑම නොකළ යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයින්ට මුක්තිය හිමිවන බව.

30. මෙම පනතේ විධිවිධාන නොතකා සමූපකාර සමිතියක් විසින් එහි කාර්යක්ෂම තම කටයුතු පවත්වාගෙන යාම පිණිස -

කොන්ත්‍රාත් අනියම් හෝ දෛනික ගෙවීම් පදනම මත බඳවා ගන්නා ලද සේවකයින්.

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව කොන්ත්‍රාත් පදනම මත නිශ්චය කරන ලද නියමයන් අනුව විශේෂඥයෙකු හෝ ප්‍රවීනයෙකු සේවය සඳහා බඳවා ගත හැක. නැතහොත්

(ආ) අනියම් හෝ දෛනිකව ගෙවීමේ පදනම මත හෝ කොටස් වැඩ වේතන ගෙවීමේ පදනම මත සේවකයින් සේවයේ යෙදිය හැක.

කෙසේ වුව ද කොමිෂන් සභාවේ අනුමැතිය නොමැතිව එවැනි සේවකයින්ට ස්ථිර තනතුරු ප්‍රදානය නොකළ යුතු ය.

වැරදි.

31. (1) කිසියම් සමූපකාර සමිතියක් හෝ කිසියම් නිලධරයෙක් හෝ සේවකයෙකු පහත සඳහන් ආකාරයට -

(අ) මෙම ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන කඩ කරන්නේ නම් ; හෝ

(ආ) කොමිෂන් සභාව හෝ එහි බලයලත් නිලධාරියෙකු යම් ක්‍රියාවක් ක්‍රියාත්මක කරන ලෙස හෝ යම් තොරතුරක් සපයන ලෙස හෝ ඉල්ලා සිටී විටක, එම ක්‍රියාව කිරීම හෝ තොරතුර සැපයීම හිතමතාම නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ එසේ කිරීම පැහැර හරින්නේ නම් ; හෝ

(ඇ) අසත්‍ය වාර්තා ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන යම් සමූපකාර සමිතියක් හෝ සේවකයෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වේ.

(2) 1 වන උපවගන්තිය යටතේ වරදක් කරන සියලුම සමූපකාර සමිති හෝ තැනැත්තන් මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ දී පවත්වන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(3) යම් සමූපකාර සමිතියක් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කළ විට, එම සමූපකාර සමිතියේ සියලුම සේවකයින් එම වරදට වරදකරු විය යුතු බවට සැලකිය යුතු ය. තව ද, තමා විසින් නිසි උද්යෝගයෙන් එම වරද සිදුවීම වැළැක්වීමට පියවර ගත් බවත්, එම වරද තමා නොදැනුවත්ව සිදු වූ බවත් ඔප්පු කළහොත්, එම වරදට ඔහු වරදකරු වශයෙන් නොසැලකිය යුතු ය.

(4) කිසියම් සේවකයෙකු යලි සේවයේ පිහිටුවීම සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නියෝගයක් ක්‍රියාත්මක කිරීමට යම් සමූපකාර සමිතියක් පැහැර හැරිය විට, එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් අයෙකු හෝ සියලුම දෙනා ඉවත් කිරීමට ද ඇතුළුව එම සමිතියට එරෙහිව සුදුසු නියෝගයක් කළ හැකි වන්නේ ය.

කොමිෂන් සභාවේ කටයුතුවලට මැදිහත් වීම.

32. යම් පුද්ගලයෙකු ඔහු/ඇයගේ නීත්‍යානුකූල කටයුතුවලින් තොරව සෘජුව හෝ අන්‍යාකාරයකින්, වෙනත් අයෙකු මගින් කුමන හෝ ආකාරයට කොමිෂන් සභාවේ හෝ එහි සාමාජිකයෙකුගේ තීරණවලට බලපෑම් කිරීම, බලපෑම් කිරීමට උත්සාහ කිරීම වරදක් වේ. ලඝු නඩු විභාගයකින් පසුව එවන් වරදකට වරදකරු වුවහොත්, රුපියල් පන්දහකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි සිරදඬුවමකට හෝ එම දඩය හා සිරදඬුවම යන දෙකටම යටත් වන්නේ ය.

අනවසර තොරතුරු හෙළිදරව් තහනම් බව.

33. කොමිෂන් සභාවේ සාමාජිකයෙකු හෝ කොමිෂන් සභාවේ ලේකම් හෝ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ යම් නිලධාරියෙකු හෝ වෙනත් පුද්ගලයෙකු ඔහුගේ නිල රාජකාරි කටයුතු වලදී හැර ඔහු/ඇයගේ රාජකාරි කටයුතුවල දී දැනගත් ලේඛනවල අඩංගු කරුණු හෝ තොරතුරු වෙනත් අයෙකුට ප්‍රචාරය කිරීම හෝ හෙළිදරව් කිරීම නොකළ යුත්තේ ය.

කොමිෂන් සභාවේ වාචික සටහන් වරප්‍රසාද යුක්ත බව.

34. කොමිෂන් සභාව හෝ එහි යම් සාමාජිකයෙකු හෝ කොමිෂන් සභාවේ සේවකයෙකු හෝ යම් සමූපකාර සමිතියක් හෝ එම සමිතියේ කාරක සභිකයෙකු හෝ එම සමිතියේ යම් සේවකයෙකුගේ සාමාජිකයෙකු අතරේ කොමිෂන් සභාවේ රාජකාරී කාර්යයන් නිම කිරීම සම්බන්ධව හුවමාරු කරන ලද ලිඛිත සටහන්වල හෝ වාචික සටහන්වල ඇතුළත් කිසියම් කරුණක් නීතිමය කටයුතුවල දී ඉදිරිපත් කිරීමට හෝ ප්‍රකාශ කිරීමට කොමිෂන් සභාවේ සභාපතිගේ ලිඛිත අනුමැතියක් තිබේ නම් මිස, කිසිවෙකුට අනුමැතිය නොතිබිය යුතු ය.

සමූපකාර සමිතිය සහ එහි සේවකයින්ට කම්කරු ආරවුල් පනත අදාළවීම.

35. (1) සමූපකාර සමිතියක යම් සේවකයෙකු විසින් සහන පතා සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක එම කරුණු හෝ එහි අන්තර්ගතයට ඇතුළත් වන වෙනත් ඉල්ලීම් සම්බන්ධයෙන් කම්කරු ආරවුල් පනතේ 31 (ආ) වගන්තිය යටතේ සහන පතා කරන ඉල්ලීම් කිසිවක් කාර්මික ආරාවුල් ආඥපනත යටතේ පිහිටුවා ඇති කම්කරු විනිශ්චය සභාවක් විසින් භාර නොගත යුත්තේ ය

(2) එසේම යම් සේවකයෙකු සහන පතා ඉල්ලීමක් කම්කරු ආරවුල් පනත යටතේ පිහිටුවා ඇති කම්කරු විනිශ්චය සභාවකට එම පනතේ 31 (ආ) වගන්තිය යටතේ ඉදිරිපත් කර ඇති විටක, එවන් සේවකයෙකුගේ අභියාචනයක් කොමිෂන් සභාව විසින් භාර නොගත යුතු වන්නේ ය.

36. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අපැහැදිළි තැන්වල දී දෙමළ පාඨය බලපැවැත්විය යුතු බව.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම ප්‍රඥප්තියේ අර්ථ නිරූපණය.

"අමාත්‍යවරයා" යනු උතුරු පළාතේ පළාත් සභාවේ සමූපකාර විෂය පවරා දී ඇති අමාත්‍යවරයා වශයෙන් අදහස් කෙරේ.

"කොමිෂන් සභාව" යනු උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව යන්න අදහස් කෙරේ.

"කොමසාරිස්" යනු උතුරු පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ උතුරු පළාත් සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් යන්න අදහස් කෙරේ.

"සමූපකාර සමිති" යනු උතුරු පළාත් සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි වූ සමිතිය යන්න අදහස් කෙරේ.

"පළාත" යනු පරිපාලන උතුරු පළාත යන්න අදහස් කෙරේ.

"දිස්ත්‍රික්කය" යනු ප්‍රඥප්තිය යටතේ විස්තර වන පරිපාලන දිස්ත්‍රික්ක යන්න අදහස් කෙරේ.

"සේවකයා" යනු උතුරු පළාත් සමූපකාර සමිතියක පත්වීම් ලැබ වැටුප් හෝ වේතන ලබන සේවකයෙකු වශයෙන් අදහස් කෙරේ.

## උපලේඛනය I

### උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික විසින් උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ප්‍රඥප්තියේ 10 (1) වැනි වගන්තිය අනුව දිවුරුම් දීම, ප්‍රතිඥා දීම.

උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික වශයෙන් පත්වීම් ලැබ සිටින ...................................................................... වන මම, මා වෙත භාර කරන ලද උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික ධුරයේ කාර්යයන් ගම්භීරතා පූර්වක අපක්ෂපාති මානසික හැඟීමෙන් හෝ ද්වේශයක් නොමැතිව සම්පූර්ණයෙන්, අවංකව හා සාධාරණව ඉටු කරන බවටත්, මාගේ කාර්යයන් ඉටු කිරීමේදී ඉහත සඳහන් ධුරයට අදළ කාර්යයන් සම්බන්ධව කිසියම් කරුණක් රාජකාරී අනුව හැර ඍජුව හෝ වක්‍රව කිසිවෙකුට හෙළිදරව් නොකරන බව අවංකව හා ගම්භීරතා පූර්වකව දිවුරා ප්‍රකාශ කරමි, ප්‍රතිඥා දෙමි.

අත්සන,

සභාපති/සාමාජික

20........... වර්ෂයේ ...............මාස ............. වැනි දින මා ඉදිරියේදී දිවුරුම් දෙන ලදී./ප්‍රතිඥා දෙන ලදී.

...................................................................,
පළාත්බද මහාධිකරණ විනිසුරු.

## උපලේඛනය II

## උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්/සේවකයින් විසින් උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ප්‍රඥප්තියේ 10 (2) වැනි වගන්තිය යටතේ දිවුරුම් දීම, ප්‍රතිඥා දීම.

උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්/සේවක වශයෙන් අදාළ ධුරයේ කාර්යයන් ඉටු කිරීමට නියම කරන ලද ........................................................................ වන මම, මා වෙත පවරන ලද උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/සේවක ධුරයේ කාර්යයන් ඉටු කිරීම හැර අන් ආකාරයෙන් අදාළ තනතුරේ කාර්යයන් ඉටු කිරීමේ දී මා දැනගත් ලිපි ලේඛණවල සඳහන් සටහන්වල තොරතුරු සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් සෘජුව හෝ වක්‍රව හෝ කිසියම් තැනැත්තකුට ප්‍රකාශ නොකරන බවට අවංකව හා ගම්භීරතා පූර්වකව දිවරුම් දෙමි, ප්‍රතිඥා දෙමි.

.......................................
අත්සනග

20........... වර්ෂයේ ............... මස ............. වැනි දින මා ඉදිරියේදී දිවුරුම් දෙන ලදී./ප්‍රතිඥා දෙන ලදී.

..................................................................,
සභාපති,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
උතුරු පළාත් සභාව.

08 - 563